# ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ බෞද්ධ විහාරාරාම වර්ගීකරණය හා අන්තර්ගත ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්


එන්.එස්. ජයසේකර

දෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*shashikalanimali7@gmail.com*


මහජනයාගේ හිතසුව පිණිස දහම් චාරිකාවේ නිරතවිය යුතු ය. යන බුදු වදනට අනුව භික්ෂූන් වහන්සේලා තැනින් තැන ඇවිදිමින් දහම් දේශනා කිරීමට කටයුතු කළහ. ඒ සමයේ දී උන් වහන්සේලාට ස්ථිර විහාරාරාමයක් නොවී ය. එබැවින් සංඝයා වහන්සේලාට සිදු වූයේ කැලෑවල, ගස්මුල්වල, පිදුරු ගොඩවල් ආදී ස්ථානයන්හි වැඩවාසය කිරීමට ය. සංඝයා වහන්සේලා දහම් දේශනා කිරීමේ දී අත්විඳි දුෂ්කරතා අවබෝධ කරගත් රජගහනුවර සිටුවරයා භික්ෂූන් සඳහා විහාරාරාමයක් කර දීමට බුදුරදුන්ගෙන් අවසර ඉල්ලා සිටියේ ය. ඒ අනුව රජගහනුවර සිටුවරයා එක් දිනක දී විහාරාරාම හැටක් ඉදිකර ඒවා පිළිගන්නා ලෙස බුදුරදුන්ගෙන් ඉල්ලාසිටි අවස්ථාවක දී එම විහාරාරාම සතර දිශාවෙන් පැමිණි නොපැමිණි සංඝයාට අයත්වන පරිදි පූජා කිරීම සුදුසු බව දේශනා කළේ ය (ගුණවර්ධන, 2010:19). මේ මඟින් පැහැදිලි වන්නේ තැනින් තැන ඇවිදිමින් සංචාරක ජීවිතයක් ගත කිරීමෙන් විහාරාරාම ගොඩනැගිලිවල වාසය කිරීමට හුරුපුරුදු වූ බවයි.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳ ව විමසා බැලීමේ දී බෞද්ධ විහාරාරාමයන්හි ආරම්භය ක්‍රි.පූ. 3 වැනි සියවස තුළ දී පවා තිබෙන්නට ඇති බව වංසකථා තොරතුරු අනුව පැහැදිලි වේ (ගුණවර්ධන, 2010:30). විශේෂයෙන් අනුරාධපුර ඇතුල්නුවර පුරාවිද්‍යා කැණීම් මඟින් හමු වී ඇති කටුමැටි වරිච්චි බිත්ති සහිත වාස්තුවිද්‍යා සාක්ෂි අනුව මුල්කාලීන ආරාම මෙම තාක්ෂණයෙන් යුක්ත ව තිබෙන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය (ගුණවර්ධන,2010:30). ඒ අනුව අනුරාධපුර යුගය ක්‍රි.පූ. තුන් වැනි සියවසේ සිට ක්‍රිස්තු වර්ෂයෙන් දහ වැනි ශතවර්ෂය දක්වා විහිදේ. දැනට පවතින පුරාවිද්‍යා සාධක අතරින් විශාල ප්‍රමාණයක් අයත් වන්නේ බෞද්ධ විහාරාරාමයන්ට ය. මෙම ලිපිය මඟින් ඉදිරිපත් කරනු ලබන්නේ එම විහාරාරාමයන්හි වර්ගීකරණයන් හා ඒවායේ අන්තර්ගත ලක්ෂණයන් පිළිබඳව ය.

දැනට හඳුනාගෙන තහවුරු කරගෙන ඇති වාස්තු විද්‍යාත්මක විහාරාරාම නිර්මාණයන් බොහෝමයක් අනුරාධපුර යුගයේ මධ්‍ය හා අවසාන භාගයට අයත් වේ (ගුණවර්ධන,

2010:31). ආදිකාලීන යුගයට අයත් විහාරාරාම පිළිබඳ ව මෑතක් වනතෙක් ම අදහස් හා තොරතුරු ඉදිරිපත් කර තිබුනේ බොහෝවිට වංසකතා තොරතුරු පදනම් කරගෙන ය. නමුත් පුරාවිද්‍යාත්මක විෂයේ වර්ධනය සහ උනන්දුව හේතුකොටගෙන ආදිකාලීන අවශේෂ පොළව යටින් මතුකොට තහවුරු කිරීමෙන් ලංකාවේ විහාරාරාම ඉතිහාසය පිළිබඳ ව ක්‍රමානුකූල අදහසක් ඉදිරිපත් කිරීමට හැකි වී තිබේ. දැනට සොයාගෙන ඇති එම වාස්තු විද්‍යාත්මක නිර්මාණයන් හා ආකෘතීන් පදනම් කරගෙන එම විහාරාරාම,

- චෛත්‍රීය හෙවත් ලෙන් විහාරාරාම
- නාගරික විහාරාරාම හෙවත් මහාවිහාර වර්ගයට අයත් විහාරාරාම
- පබ්බතාරාම හෙවත් ප්‍රාදේශීය විහාර
- පධානඝර හෙවත් ද්විත්ව වේදිකා ගොඩනැගිලි විහාරාරාම

වශයෙන් පුළුල් ව වර්ගීකරණයට ලක්කළ හැකිය.

ලෙන් විහාරාරාම හෙවත් චෛත්‍රීය වර්ගයේ විහාරාරාම යනු දැනට හඳුනාගෙන ඇති පැරණි ම විහාරාරාම වර්ගයයි. සංඝයා වහන්සේලා තැනින් තැන සංචාරය කොට ආගම ප්‍රචාරය කිරීම සඳහා කටයුතු කිරීමේ දී ස්වාභාවික පරිසරයේ පැවති ස්වාභාවික ගල්ලෙන් තම ආවාස ලෙස තෝරා ගත්හ. එබඳු විහාරාරාම ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථානවලින් හඳුනාගෙන ඇත. මිහින්තලය, සිතුල්පව්ව, පිදුරංගල ආදී ස්ථානවලින් ප්‍රකට කරනුයේ එවැනි මුල්කාලීන විහාරාරාම අංග හඳුනාගත හැකි වැදගත් විහාරාරාමයන් ය. මේ ස්ථාන සතු කඳු පර්වත වැනි ස්වාභාවික ලක්ෂණ කේන්ද්‍ර කර ගනිමින් ලෙන් විහාර ඉදිකිරීම හා ඒවා නැවත අලුත්වැඩියා කිරීම දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණි. සමස්තයක් ලෙස ගත් කළ මෙම විහාරාරාම ජ්‍යාමිතික සැලැස්මක් රහිත ආකෘතියක් ලෙස සැලකිය නොහැකි ය. ස්වාභාවික ව පැවති මෙම ලෙන් විහාර දෙදහසකට ආසන්න සංඛ්‍යාවක් මුල් කාලීන සංඝයාගේ වාසස්ථාන ලෙස භාවිතා වූ බවට ශ්‍රී ලංකාව පුරා පැතිරී ඇති එම ලෙන් පරීක්ෂා කිරීමේ දී පෙනීයයි. විශේෂයෙන් තත්කාලීන සමාජයේ ජීවත් වූ පරුමකවරු, ගමණිවරු, ගහපතිවරු වැනි ප්‍රභූපිරිස් හා උපාසක වැනි සාමාන්‍ය ජනතාව මෙම ලෙන් සකස්කර භික්ෂූන්ට පූජාකරන ලදී (ගුණවර්ධන,2010:32). මෙම ලෙන්වල කොටා ඇති පූර්ව බ්‍රාහ්මී අක්ෂර පදනම් කරගෙන ලෙන් විහාර මුල් කාලයේ දී භික්ෂූන්ගේ වාසස්ථාන ලෙස පරිහරණය වූ බවට සාපේක්ෂ වශයෙන් කාලනීර්ණය කළ හැකි ය.

මහාවිහාරාරාම වර්ගයට අයත් විහාරයන්ගේ මූලික සැලැස්ම ලෙන් විහාර වර්ගයට වඩා හාත්පසින් ම වෙනස් වූවකි. එය වූ කලී ලංකාවේ විහාරාරාම ඉතිහාසය තුළ පූර්ව සැලැස්මක් සහිත ව ඉදිකරන ලද ප්‍රථම වර්ගය ලෙස සඳහන් කළ හැකි ය. එහි දී සමස්ත විහාරාරාම සංකීර්ණය ම ඉදිකරනු ලබන්නේ ස්තූපයක් හෝ වටදාගෙයක් කේන්ද්‍ර කොටගෙන ය (ගුණවර්ධන, 2010:32). අනුරාධපුර රුවන්වැලිසෑය,අභයගිරිය, ජේතවනය,

මිරිසවැටිය ආදී දැවැන්ත ස්තූපයන් ද ථූපාරාමය, ලංකාරාමය ආදී වටදාගෙවල් කේන්ද්‍රකොට ඉදිවී ඇති විහාරාරාම සංකීර්ණ මඟින් මහාවිහාරාරාම හෝ නාගරික වර්ගය නිරූපණය වේ. අනුරාධපුරට සමකාලීන ව මාගම අගනුවර යටතේ වර්ධනය වූ තිස්සමහාරාම, යටාලවෙහෙර, සඳගිරි දාගැබ මඟින්ද හෙළි කරන්නේ මහාවිහාරාරාම සම්ප්‍රදායයි. මෙහි තදාශ්‍රිත ප්‍රදේශයේ ආගමික අංගයන් වන ප්‍රතිමාගෘහය, පොහොයගෙය හා භික්ෂූන්ගේ ආවාස ගොඩනැගිලි පිහිටා ඇත (ගුණවර්ධන, 2010:32). එසේ ම ආගමික අංග නොවන නේවාසික කටයුතුවලදී උපකාර වන ලැගුම් ගෙවල්, දාන ශාලාව, ජන්තාඝර, කැසිකිලි, වැසිකිලි, පොකුණු, ළිං ද දැකිය හැකිය. කේන්ද්‍රික සැලසුමක් සහිත මෙම මහාවිහාර ඒ ඒ භූමිවල ඉඩ ප්‍රමාණය සැලසුම්කරණය පදනම් කරමින් විහාර තුළ දී විවිධ වාස්තුවිද්‍යා අංග ස්ථානගතකර තිබීම ද කැපී පෙනේ(ගුණවර්ධන, 2010:32).

පබ්බත විහාරාරාම යනු ආර්ථික ප්‍රතිලාභ වෙන් කිරීමෙන් ඉදිකරනු ලැබූ විහාරාරාම වර්ගයකි. ක්‍රි.ව 5-7 සියවස්වල ප්‍රාදේශීය නැතහොත් අර්ධ නාගරික භූගෝලීය කලාප ඔස්සේ වර්ධනය වූ සම්ප්‍රදායක් ලෙස මෙය හඳුනාගත හැකි ය. මෙය විහාරාරාම ආකෘතිය තව දුරටත් වර්ධනය කොට සංකීර්ණ මට්ටමින් විහාර සැලැස්ම ඉදිරිපත් කිරීමට යෙදවූ ප්‍රයත්නයක් ලෙස සැලකිය හැකි ය (ගුණවර්ධන, 2010:33). ප්‍රධාන සැලැස්ම තුළ පිහිටි ස්තූපය, බෝධිය, ප්‍රතිමාගෘහය, පොහොය ගෙය යන පූජනීය අංගයන් හා ප්‍රධාන නොවන සැලැස්ම තුළ භික්ෂු ආවාස, භෝජනශාලා, ජන්තාඝාර, කැසිකිලි, වැසිකිලි ආදීන්ගෙන් සමන්විත විය. මෙම විහාරාරාම තොලුවිල විජයාරාමය, පංකුලිය, කලුදියපොකුණ, සීගිරිය හා දඹුල්ල ප්‍රදේශයේ පිහිටි මැණික්දෙන, පිදුරංගල හා රාමකැලේ වඩාත් ප්‍රසිද්ධ ස්ථානවල පිහිටා තිබේ. මහාවිහාරාරාම සම්ප්‍රදායේ සැලසුමේ දී ස්තූපය මූලිකවන අතර පබ්බතාරාම සැලසුමේ මූලික වනුයේ බෝධිය, දාගැබ, පිළිමගෙය, පොහොයගෙය යන අංශ වීම කැපී පෙනේ. (සෝමානන්ද, 2013:121)

පධානඝර විහාරාරාම හෙවත් ද්විත්ව වේදිකා ගොඩනැගිලි හෝ තපෝවනාරාම වශයෙන් හැඳින්වෙන විහාරාරාම වර්ගය වූ කලී යෝගාවචර භික්ෂූන් සඳහා ඉදිකරන ලද්දකි (ගුණවර්ධන,2010:34). අනුරාධපුර යුගයේ අවසන් භාගයේ දී ශාසන ඉතිහාසයේ ඇති වූ විවිධ මතිමතාන්තර හේතුකොටගෙන මහාවිහාරයේ භික්ෂූන් වහන්සේලා සමූහයක් මෙම වර්ගයේ විහාරාරාමවල වාසය කිරීම සඳහා නික්ම ගිය බව වාර්තා වේ (ගුණවර්ධන, 2010:34). අනුරාධපුර බටහිරාරාමය,අරන්කැලේ,වෙහෙරබැදි--ගල ඇතුළු ස්ථාන 12ක් පමණ දැනට මෙම විහාරාරාම වර්ගය හඳුනාගෙන ඇත. උස්ව පිහිටි ආයත චතුරස්‍රාකාර ගොඩනැගිලි දෙකක් දැවැන්ත ගල් පාලමක් මඟින් එක්තැන් කිරීමෙන් විහාරාරාම ආකෘතිය සකස් වේ (wijesuriya, 1998). මේ හේතුවෙන් එච්.සී.පී. බෙල් මහතා මේවා ද්වි වේදික ගොඩනැගිලි වශයෙන් හඳුන්වා ඇත (සෝමානන්ද, 2013:125). මෙම වේදිකා දෙකෙන් එකක් විවෘත මණ්ඩපයක් වූ අතර අනෙක බිත්තිවලින් වට කරනු ලැබූවකි.

ගොඩනැගිල්ල ඇතුලත බිත්තිය සිසිල් කර තබාගැනීම සඳහා දිය අගලක් හෝ පොකුණක් එයට සම්බන්ධ කර තිබීම දක්නට හැකි ය. විශේෂයෙන් මෙහි පිටුපස ඇති ගර්භ ගොඩනැගිල්ල ඉදිවන්නේ ස්වභාවික පර්වතයක් මත ය. මෙම පිටුපස ගොඩනැගිල්ල මෙම විහාරයේ සංඝාරාමය වේ. ඉදිරිපස වේදිකා ගොඩනැගිල්ල විවෘත ව පැවති ප්‍රදේශයක් වන අතර එය බණ භාවනා සඳහා වෙන් වී තිබූ මලුවක් බව සිතිය හැකි ය. මෙම සැලසුම් තුළ පූජා ගොඩනැගිලි කිසිවක් නොමැති අතර අලංකාර ලියවැල් මල්කම් මෝස්තර ආදිය ද දැකිය නොහැකි ය. එහෙත් කැසිකිලි ගල පමණක් අලංකාර විමාන කැටයම්වලින් සම්පූර්ණ කර තිබිණි. එය වූ කලී භික්ෂුවට අනිත්‍යතාවය සිහිගැන්වීමට යැයි විද්වතුන් පෙන්වා දී ඇත.

ක්‍රි.පූ තුන් වැනි සියවසේ දී බුදුදහම ලංකාවේ පිහිට වූ වකවානුවේ සිට ආරම්භ වූ බෞද්ධ විහාරාරාම සංඛ්‍යාව ක්‍රමක් ක්‍රමයෙන් වර්ධනය වෙමින් ගොස් අනුරාධපුර අවසාන භාගයේ දී ඉතා සීඝ්‍ර ලෙස ව්‍යාප්ත වී ඇත. මුල් කාලයේ දී මෙම විහාරාරාම සැලසුමකට නොතිබුණු අතර පසු කාලයේ දී ඒවා සැලසුමකට අනුව නිර්මාණය වුණි (ගුණවර්ධන,2010:29). කලක් ගතවීමේ දී විහාරාරාමයන් අවට පරිසරය හා භූදර්ශනය සකස් කිරීම කෙරෙහි අවධානය යොමුවිය. එසේ සිදු වූයේ කල්යත් ම සැදැහැවතුන් විශාල සංඛ්‍යාවක් විහාරාරාම වෙත පැමිණීම ය. තනි ඒකකයක් ලෙස පැවති විහාරාරාම ගොඩනැගිල්ල තුළ කටයුතු කිරීමේ දී විවිධ දුෂ්කරතා ඇති වූ නිසා එය ගොඩනැගිලි කුඩා ඒකකයකට බෙදා වෙන් කිරීමට සිදු විය. මෙම තොරතුරුවලින් හෙළිවන්නේ තනි ඒකකයක් වශයෙන් පැවති විහාරාරාමය එක් එක් ස්වාධීන ආවාස බවට පරිවර්තනය වී අවට භූ දර්ශනය තුළ පවා ගොඩනැගිලි ඉදිකරමින් ක්‍රමයෙන් සංවර්ධන තත්ත්වයකට පත් වූ ආකාරයයි. මෙම ගොඩනැගිලි ඉදිකිරීමේ ස්වරූපය ඓතිහාසික ලංකාව පාලනය කළ රාජවංශය හා භික්ෂූන් වහන්සේලාගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාවේ ප්‍රතිඵලයක් බව පෙනේ. මෙම වර්ධනය සඳහා භික්ෂු සමාජය තුළ වූ ආකල්ප හා ආගමික කරුණු ද පදනම් වූ බව මේ පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. එසේම ජන සමාජය තුළ පැවතියා වූ සමාජ ආර්ථික දේශපාලන කරුණු මේ සඳහා බලපාන්නට ඇතැයි අනුමාන කළ හැකි ය.